අධ්‍යාපන අමාත්‍යාංශය - තාක්ෂණ අධ්‍යාපන ශාඛාව,

28 ගෘහ ආර්ථික විද්‍යාව

2024 අ.පො.ස(උසස් පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කාලය පැය 02

I - පත්‍රය

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා එය පිළිපදින්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) , (2) ,(3) , (4) , (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි (×) යොදා දක්වන්න.**

---

01. විවිධ ආකාරයේ රේඛා මගින් ඇති කරන හැගීම් විවිධ වේ.ඒ අනුව තිරස් රේඛා මගින් ඇති කරන හැගීම් වනුයේ,

1. උස්බව, ඍජුබව සහ ගෞරවනීය බවයි.
2. තැන්පත් බව, මිටි බව සහ කෝමල බවයි.
3. කලබලකාරි බව, ශාන්ත බව සහ මිටි බවයි.
4. තැන්පත් බව, පුළුල් බව සහ ශාන්ත බවයි.
5. ක්‍රියාශීලී බව, චලනය සහ ශාන්ත බවයි.

02 . ප්‍රශස්ත ජීවන පරිසරයක් නිර්මාණයේ දී භෞතික පරිසරය මෙන් ම අවධානය යොමු කළ යුතු පරිසරය වනුයේ,

1. ග්‍රාමීය පරිසරය ය.
2. නාගරික පරිසරය ය .
3. සමාජ පරිසරය ය .
4. සුමට භූ දර්ශන පරිසරය ය.
5. දෘඪ භූ දර්ශන සහිත පරිසරය ය.

03. පරිසරයට කාබන් මුදා හැරීම, ජල භාවිතය, ශක්ති පරිභෝජනය හා මුදාහරින අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීමෙන් ඉදිකරන ගොඩනැගිලි හඳුන්වන්නේ,

1. නූතන සංකල්පයේ ගොඩනැගිලි ලෙසිනි.
2. පශ්චාත් නූතන සංකල්පයේ ගොඩනැගිලි ලෙසිනි.
3. අනුකූලත්වයට අනුව ඉදි වූ ගොඩනැගිලි ලෙසිනි.
4. හරිත සංකල්පයට අනුව ඉදි වූ ගොඩනැගිලි ලෙසිනි.
5. සන්දර්භය යටතේ ඉදි වූ ගොඩනැගිලි ලෙසිනි.

04. ගොඩනැගිලි නිර්මාණය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

a) වහලය හා සිවිලිම සඳහා තාප පරිවාරක ද්‍රව්‍ය යෙදීම වඩාත් සුදුසු ය.
b) ගොඩනැගිල්ලේ උතුරු පැත්තට හා දකුණු පැත්තට ඝනකම අඩු බිත්ති යොදා ගැනීම සුදුසු නොවේ.
c) සුදු පැහැ පොළොව අවකාශයේ ප්‍රමාණය හකුළුවා දක්වන අතර තදපැහැ පොළොව අවකාශයේ ප්‍රමාණය විශාල කර දක්වයි.
d) කෘත්‍රිම ආලෝකය හැකි තරම් අවම ප්‍රමාණයක් යොදා ගත යුතුය.
e) ආලෝකය ලබා ගැනීම පිණිස ජනේලවලට භාවිත කර ඇති වීදුරු වර්ග හා බිත්ති වල වර්ණය කාමරයේ විශාලත්වය කෙරෙහි බලපෑමක් ඇති කරයි.

මින් **නිවැරදි** ප්‍රකාශය වන්නේ,

1).a ,b සහ c ය .
2). a ,d සහ e ය .
3). b ,c සහ e ය
4).b ,d සහ e ය .
5). a ,c සහ d ය .

5. ආහාරයක සංයුතියෙහි හයිඩ්‍රජන් හා ඔක්සිජන් අතර අනුපාතය 2:1 වන්නේ,

1).මේදවල ය . 2).ප්‍රෝටීන් හා මේදවල ය . 3).කාබෝහයිඩ්‍රේටවල ය .
4).ප්‍රෝටීන්වල ය . 5).කාබෝහයිඩ්‍රේට හා මේදවල ය .

6. විටමින් B කාණ්ඩයට අයත් ෆෝලික් අම්ලය සහ ඇවිඩීන් හඳුන්වනුයේ පිළිවෙලින්,

1. විටමින් B_1 සහ B_2 ලෙස ය.
2. විටමින් B_8 සහ B_{12} ලෙස ය.
3. විටමින් B_7 සහ B_{11} ලෙස ය.
4. විටමින් B_6 සහ B_3 ලෙස ය.
5. විටමින් B_9 සහ B_4 ලෙස ය.

7. අත්‍යවශ්‍ය සහ අත්‍යවශ්‍ය නොවන ඇමයිනෝ අම්ල **දෙකක්** පිළිවෙලින් දක්වා ඇති පිළිතුර කුමක්ද?

1. ආජිනීන් සහ ලියුසීන් 2.හිස්ටිඩීන් සහ වැලීන් 3.ලියුසීන් සහ සිස්ටීන්
4. තයිරොසීන් සහ වැලීන් 5. ට්‍රිප්ටොපෑන් සහ මෙතියොනීන්

8. විටමින් A ඌනතාව නිසා මිනිසා තුළ පිළිබිඹු කරනු ලබන ඌනතා රෝග **දෙකක්** වනුයේ,

1. බිටෝල්පප සහ ගලගණ්ඩය ය
2. රිකට්සියාව සහ ස්කර්වි ය
3. ඔස්ටියෝමැලේෂියාව සහ කෙරෙටොමැලේෂියාව ය
4. අස්ථි ක්ෂීණතාව සහ අස්ථි මාර්දව ය
5. සෙරොප්තැල්මියාව සහ කෙරෙටොමැලේෂියාව ය

9.ආහාර පිසීමේදී භාවිත වන මෘදු කාරකයක් සහ උකු කාරකයක් පිළිවෙලින් දැක්වෙන වරණය කුමක්ද?

1.සියඹලා සහ අමු ගස්ලබු 2.හාල්පිටි සහ පොල් කිරි 3.ගොරකා සහ විනාකිරි
4.සීනි සහ ගොරකා 5.අමු ගස්ලබු සහ හාල්පිටි

10.මානව ජීවන චක්‍රය තුළ පෝෂණ අවශ්‍යතා වැඩිම අවධි දෙකක් දැක්වෙන පිළිතුර කුමක්ද?

1.ගර්භණී සහ ක්ෂිරණ අවධිය 2. ළදරු සහ ළමා අවධි 3.මහළු සහ වැඩිහිටි අවධිය

4.ක්ෂීරණ සහ ළදරු අවධිය 5.නවයොවුන් අවධිය සහ ගර්භණී අවධිය

11.පෙක්ටීන් බහුල ආහාර ද්‍රව්‍ය අඩංගු වරණය තෝරන්න.

1. දෙළුම්, පේර, සහ බෙලි
2. දිවුල්, සැපතිල්ලා සහ අන්නාසි
3. අන්නාසි, දෙළුම් සහ බෙලි
4. පේර, දිවුල් සහ සැපතිල්ලා
5. බෙලි, අන්නාසි සහ කෙසෙල්

12.පහත සඳහන් ප්‍රකාශ අතරෙන් **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. සයනොකොබැලමීන් අඩංගු ආහාර ලෙස මස්, මාළු හා කෙසෙල් නම් කළ හැකි ය.
2. මාංශමය ආහාර මගින් හීම් යකඩ ලබා දෙයි.
3. ආහාර රසකාරකයක් වන ගොරකාවල ටාටරික් අම්ලය අඩංගු වේ.
4. නිවුඩු සහල්වල අඩංගු ෆයිටික් අම්ලය මගින් අයඩින් හා පොටෑසියම් අවශෝෂණයට බාධා ඇති වේ.
5. ප්‍රතිඔක්සිකාරක ලෙස ක්‍රියාකරන විටමින් ලෙස A, E හා B නම් කළ හැකිය.

13.හෘදයාබාධ වැළැක්වීමට ගතයුතු වඩාත් **සුදුසු** ආහාර වන්නේ,

1. බිත්තර සුදුමද හා නිවුඩු හාලේ බත් ය.
2. සම්බා හාලේ බත් හා හාල් පිටි ඉඳි ආප්ප ය.
3. බටර් ගාන ලද පාන් හා අලුත් මාළු ය.
4. මේද සහිත කිරි හා බිත්තර සුදු මද ය.
5. සියලු පලතුරු හා බදින ලද කුකුළු මස් ය.

14.පහත දැක්වෙන්නේ රෝග ලක්ෂණ කීපයකි.

- දෙපාවල සංවේදිතාව අඩු වීම
- ඇසේ දෘෂ්ඨී විතානයට හානි වීම
- වකුගඩු අකර්මන්‍ය වීම
- ආඝාතය ඇතිවීම

ඉහත සංකූලතා පෙන්නුම් කරන රෝගය වන්නේ,

1).හෘදයාබාධය ය. 2).දියවැඩියාව ය. 3).ස්ථූලතාව ය.
4).අධිරුධිර පීඩනය ය. 5). ආමාශයික ප්‍රදාහය ය.

15. පිෂ්ඨය ජෙලටීනීකරණය සිදුවන අවස්ථාවක් වන්නේ,

1).බතල තැම්බීමේ දී ය. 2).කැරමල් පුඩින් සෑදීමේ දී ය. 3).බිත්තර සුදුමද ගැසීමේ දී ය.
4).අඹ ජෑම් සෑදීමේ දී ය. 5). වම්බටු මෝජු සෑදීමේ දී ය.

16. ගැඹුරු තෙලේ බැදීමට යෝග්‍ය තෙල් වර්ගයක් වන්නේ,

1).සූරියකාන්ත තෙල් ය. 2).එළවළු තෙල් ය. 3).පොල් තෙල් ය.
4).තල තෙල් ය. 5).සෝයා තෙල් ය.

17. ෂූ පේස්ට්‍රිය ආශ්‍රිතව සකස් කරන සුළු කෑම වර්ග වනුයේ

1. හොට් ඩෝග්, ක්‍රීම් බනිස් හා පැටිස් ය.
2. ක්‍රීම් බනිස්, ප්‍රොපිටරෝල්ස් හා ඉක්ලෙයාස් ය.
3. පේස්ට්‍රි බාස්කට්, පැටිස් හා ක්‍රීම් බනිස් ය.
4. මාළු පාන්, බර්ගර්, හා හොට්ඩෝග් ය.
5. ප්‍රොපිටරෝල්ස්, ඉක්ලෙයාස් හා පෙස්ට්‍රි බාස්කට් ය.

18. ක්ෂුද්‍ර තරංග මගින් හා ගැඹුරු තෙලේ ආහාර පිසීමේදි සිදුවන තාප සංක්‍රාමණ ක්‍රම වන්නේ පිළිවෙළින්

1).සන්නයනය සහ විකිරණය යි. 2).විකිරණය සහ සන්නයනය යි.
3). සංවහනය සහ සන්නයනය යි. 4).සන්නයනය සහ සංවහනය යි
5).විකිරණය සහ සංවහනය යි.

19.ප්‍රතිව්‍යුහගත කරන ලද පිෂ්ඨය අඩංගු ආහාර ද්‍රව්‍ය වන්නේ,

1).තිරිඟු පිටි හා කිතුල් පැණි ය. 2).හබල පෙති සහ ජෑම් ය.
3).රුලං හා හබල පෙති ය. 4).සම්බා සහල් සහ රුලං ය.
5).ජෑම් සහ ජෙලි ය.

20.ආහාර පරිරක්ෂණ ක්‍රමයකදී පහත දැක්වෙන ප්‍රතිඵල ලැබේ.

- ආහාරයේ අඩංගු වර්ණය නොවෙනස් වේ.
- ආහාරයේ අඩංගු එන්සයිම අක්‍රිය වේ.
- ආහාරයේ මතුපිට පෘෂ්ඨයේ ඇති ක්ෂුද්‍ර ජීවීන් පාලනය වේ.

ඉහත දක්වා ඇති ආහාර පරිරක්ෂණ ක්‍රම ශිල්පය වන්නේ,

1).ජීවාණුහරණය යි. 2).පැස්ටරීකරණය යි. 3).උණු තාප ක්‍රමය යි.
4).උපරිතාප ක්‍රමය යි. 5). සුබ්‍රිකරණය යි.

21.මලබද්ධයෙන් පෙළෙන කාන්තාවකට **වඩාත්ම** සුදුසු දිවා ආහාර වේලකි,

1. සම්බා සහලේ බත්, මාළු ඇඹුල්තියල්, කැකිරි ව්‍යංජනය සහ අළුකෙසෙල් ව්‍යංජනය
2. නාඩු සහලේ බත්, මුං ඇට ව්‍යංජනය, කතුරුමුරුංගා කොළ තෙම්පරාදුව සහ වම්බටු මෝජුව
3. නාඩු සහලේ බත්, මාළු මිරිසට, වැටකොළු ව්‍යංජනය සහ කතුරුමුරුංගා කොළ මැල්ලුම
4. සම්බා සහලේ බත් , කුකුළු මස් ව්‍යංජනය, අල බැදුම සහ බෝංචි තෙම්පරාදුව
5. කැකුළු සහලේ බත්, හාල්මැස්සන් බැදුම, අල බැදුම හා කැරට් සම්බලය

22. පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. රටකජු, බඩඉරිඟු ආදියෙහි සැල්මොනෙල්ලා (Salmonella) බැක්ටීරියාව බෙහෙවින් අඩංගු වේ.
2. ක්ෂුද්‍රජීවී වර්ධනයට බලපාන බාහිර සාධක ලෙස ආහාරයේ අඩංගු පෝෂ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය සහ වායුගෝලීය ඔක්සිජන් බලපානු ලැබේ.
3. කෙසෙල්, නමිනං හා කජු පුහුලන් වැනි පලතුරු දුඹුරු පැහැ වීමට මෙලාඩ් ප්‍රතික්‍රියාව හේතු වේ.
4. ක්ලොස්ට්‍රිඩියම් බොටියුලිනම් (Clostridium botulinum) නම් බැක්ටීරියාව ආහාරයට එක්වීමෙන් මිනිස් සිරුරට විෂ එකතු වේ.
5. මේද අඩංගු ආහාර මුඩුවීමේ ක්‍රියාවලිය වේගවත් කරන සාධක ලෙස ජලය සහ පෝෂ්‍ය පදාර්ථ දැක්විය හැකිය.

23. නිමි ඇඳුම් කර්මාන්තය පිළිබඳ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

1. ශ්‍රී ලංකාවේ නිමි ඇඳුම් පළමුවෙන් අපනයනය කරන ලද්දේ යුරෝපීය රටවලට ය.
2. 1977 වර්ෂයේ ආරම්භ කරන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, නිමි ඇඳුම් කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවට හේතු විය.
3. යුරෝපා සංගමයේ රටවල් පමණක් ශ්‍රී ලංකාවේ නිමි ඇඳුම් ආනයනය කරයි.
4. 2020 වර්ෂයේදී නිමි ඇඳුම් අපනයනය කිරීමෙන් ලැබූ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් 70% කි.
5. නිමි ඇඳුම් නිෂ්පාදනය සඳහා අවශ්‍ය සියළුම අමුද්‍රව්‍ය හා උපාංග මෙරට නිෂ්පාදනය කරයි.

24. නිමි ඇඳුම් කර්මාන්තශාලාවක් තුළ සිදුකරන ක්‍රියාවලියට අදාළ නොවන පියවරක් වනුයේ,

1).පිරි සැළසුම් නිර්මාණය ය. 2).මාකර් සටහන් තැබීම ය. 3).පතරොම් නිර්මාණය ය.
4).රෙදිවල තත්ත්ව පරීක්ෂාව ය. 5).මෝස්තර නිර්මාණය ය.

25. නිමි ඇඳුමක් සඳහා ඇසුරුම් කිරීමට පෙර දෙනු ලබන උසස් නිමාවකි.

1. උණුසුම් තෙරපුමක් ලබා දීම.
2. අවශ්‍ය ස්ථානවලට කඩදාසි යෙදීම.
3. අදාළ ස්ථාන සඳහා විවර පියවීම් යෙදීම.
4. කැපුම් අද්දර නිම කිරීම.
5. ඇඳුමට අදාළ ලේබල් ගැසීම.

26. පහත දක්වා ඇත්තේ කෙඳි වර්ගවලට අදාළ ගුණාංග කීපයකි.

A - ඇදෙන සුළුය
B - සේදීමේදී කෙඳි දුර්වල වේ.
C - පිළිස්සීමේදී පිහාටු පිළිස්සෙන ගන්ධයක් නිකුත් වේ.
D - අම්ල හා ක්ෂාරවලට ප්‍රතික්‍රියා නොදක්වයි.
E - ඩයිවර්ග සඳහා ඉතා ඉහළ ආකර්ශනයක් ඇත.

මේ අතරින් ලෝම කෙඳිවල ගුණාංග දැක්වෙනුයේ

1).A , B සහ C මගිනි. 2). B ,C සහ D මගිනි. 3). C, D සහ E මගිනි.
4).A ,B සහ D මගිනි. 5). B , C සහ E මගිනි.

27. විෂ්කම්භය 118 cmක් වූ රවුම් මේසයක් සඳහා , මේස රෙද්දක් නිර්මාණය කිරීමට අවශ්‍ය රෙදි ප්‍රමාණය වනුයේ,

1.178cm සහ 175cm ය. 2). 178cm සහ 178cm ය. 3).175cm සහ 175cm ය.
4).175cm සහ 178cm ය. 5).178cm සහ 145cm ය.

28. වානිජ මැහුම් වර්ගයක සමාංශක පෙනුම පහත දැක්වේ.



මෙම මැහුම් ක්‍රමය හඳුන්වන්නේ,

1. තනිනූලේ දම්වැල් මැස්ම(single thread chain stitch) ලෙසය.
2. අත් මැස්ම (hand stitch) ලෙසය.
3. නොපෙනෙන මැස්ම(blind stitch) ලෙසය.
4. අගුළු මැස්ම (lock stitch) ලෙසය.
5. වැසුණු දම්වැල් මැස්ම (cover in chain stitch) ලෙසය.

29. රෙදි මතුපිට අලංකාර කිරීමේදී අනුගමනය කරන පියවර කිහිපයක් පහත දැක්වේ.

A. රෙදි සෝදා වියළා ඉස්ත්‍රික්ක කර ගැනීම
B. පිටපත් කරන ලද මෝස්තරය රැලි නොසිටින ලෙස රාමුවට ඇමීම
C. පින්සල භාවිතයෙන් වර්ණ මිශ්‍ර කිරීම
D. පින්සල හෝ ස්පොන්ච් කැබලි භාවිතයෙන් රෙද්දේ වර්ණ ගැන්වීම

මෙම පියවරවලට අදාළ මතුපිට අලංකාර කිරීමේ ක්‍රමය වනුයේ,

.

1.බතික් කිරීමයි. 2.සිදුරු තහඩු මුද්‍රණය යි. 3. රෝලර් මුද්‍රණය යි
4.තිරරාමු මුද්‍රණය යි. 5. පින්තාරු කිරීම යි.

30.කෙටි සාය පතරොම නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මිනුම් පහත දැක්වේ.

- ඉණ මිනුම 64 cm
- උකුල මිනුම 91 cm
- උකුල් එල්ලය 19.5 cm
- සාය උස 53 cm

කෙටි සාය පතරොම නිර්මාණය සඳහා අවශ්‍ය රාමුව ගොඩනැගීමේදී ගණනය කළ උකුල් මිනුම වනුයේ

1.32 cm ය. 2.45 cm ය. 3.44.5 cm ය
4.47 cm ය. 5.48 cm ය.

31.විවිධ අවස්ථාවන්ට අනුකූලව ඇඳුම් පැළඳුම් භාවිතය පිළිබඳ **අසත්‍ය** ප්‍රකාශය වන්නේ

1. රැකියාවකට / සම්මුඛ පරීක්ෂණයකට යාමේදී කාන්තාවකට ඔසරිය හෝ සාරිය වඩාත් උචිත ය.
2. රැකියාවකට යාමේදී ආභරණ අවම ලෙස පැළඳීම වඩාත් සුදුසු ය.
3. රාත්‍රියේ පවතින මංගල උත්සවවලට සුදු වර්ණය භාවිතය ඉතා සුදුසු ය.
4. පිරිමි පුද්ගලයන් ඉණ පටි හා මේස් පැළඳීමේදී තද වර්ණ භාවිත කිරීම වඩාත් සුදුසු ය.
5. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීමේදී පිරිමි පුද්ගලයන් ලා වර්ණයෙන් යුතු කමිස ඇඳීම ඉතා යෝග්‍යය.

32.සන්නිවේදන මාධ්‍යයක් ලෙස දුරකථනය නිසි ලෙස භාවිතා කිරීමේදී වඩාත් **නිවැරදි** වන්නේ
1. තෙවරක් නාද වීමෙන් පසු දුරකථනයට ප්‍රතිචාර දැක්වීම ය.
2. අනෙකුත් කාර්යන්හි දී නියැලෙමින් සංවාදයට පිළිතුරු දීම ය.
3. අනෙක්පස සිටින පුද්ගලයා අභිබවමින් සංවාදයේ නියැලීම ය.
4. අනෙක්පස සිටින පුද්ගලයාට දිගුවේලාවක් කරුණු පැහැදිලි කිරීම ය.
5. නිවැරදි ආචාර කිරීමෙන් පසු දුරකථන සංවාදයට පිවිසීම ය.

33.විවේක ක්‍රියාකාරකම් පිළිබඳ දක්වා ඇති තොරතුරු අතරින් අදාළ **නොවන** ප්‍රකාශය වනුයේ
1. විවේකය, ක්‍රියාශීලී හා ක්‍රියාශීලී නොවන ලෙස වර්ග වේ.
2. සමාජීය විවේකය, ක්‍රියාශීලී නොවන විවේකයේම කොටසක් වේ.
3. ක්‍රියාශීලී විවේක ක්‍රියාකාරකම් මගින් කායික හා මානසික සෞඛ්‍ය වර්ධනය වේ.
4. ක්‍රියාශීලී නොවන ක්‍රියාකාරකම් සඳහා අඩු ආයාසයක් යෙද වේ.
5. ක්‍රියාශීලී සහ ක්‍රියාශීලී නොවන ක්‍රියාකාරකම් සඳහා යොදන කාලය සමතුලිත විය යුතු වේ.

34.පහත දක්වා ඇත්තේ ප්‍රතිමෝදන ක්‍රියාකාරකම් කීපයකි.
A. විනෝදය සඳහා රිය පැදවීම
B. රට තුළ කෙටි චාරිකාවල නිරත වීම
C. භෝජන ශාලාවක දී ආහාර ගැනීම
D. යහළුවන් හා නෑදෑයන් වෙත යාම

ඉහත ක්‍රියාකාරකම් අතරින් උසස් සමාජ සන්තුෂ්ටිය අරමුණු කරගත් ක්‍රියාකාරකම් වනුයේ,

1.A සහ B ය. 2.A සහ C ය. 3.B සහ C ය.
4.A සහ D ය. 5. C සහ D ය.

35.සලකා බලන රටෙහි ආර්ථික බල ප්‍රදේශය තුළ නේවාසිකව සිටින පුද්ගලයන් එම රටෙන් පිටතට ආගන්තුකයන් ලෙස සිදුකරන සංචරණය වන්නේ,

1.අභ්‍යන්තර යොමුගත සංචරණය යි. 2.බාහිර යොමුගත සංචරණය යි
3.දේශීය සංචරණය යි. 4.ජාතික සංචරණය යි.
5.කලාපාන්තර සංචරණය යි.

36.සංචරණයෙහි යෙදීමෙන් පුද්ගලයාට අත්වන ප්‍රතිලාභයක් වන්නේ
1. ඍජු හා වක්‍ර රැකියා අවස්ථා උදාවීම ය.
2. රජයට අමතර බදු ආදායමක් ලබාදීම ය.
3. ධනාත්මක ස්වයං ප්‍රතිරූප වර්ධනය කර ගැනීමට හැකිවීම ය.
4. සංස්කෘතික උත්සව සංරක්ෂණය කිරීමට උදව්වීම ය.
5. ශක්තිමත් සමාජ කණ්ඩායමක් ගොඩනැගීම ය.

37.ජල නළ සවිකිරීමේදී සමාන කෙවෙණිය (plain socket) හා ඌණිත කෙවෙණිය ((Reducing socket) පිළිවෙළින් භාවිත කරනුයේ,
1. නළයේ දිශාව වෙනස් කිරීම හා නළයක් අතරට කපාටයක් සවි කිරීමට ය.
2. විශ්කම්භයෙන් අසමාන නළයක් සවිකිරීම හා නළයේ දිශාව වෙනස් කිරීමට ය.
3. නළයක් අතරට කපාටයක් සවි කිරීම හා නළ මාර්ගයට කරාමයක් සවි කිරීමට ය.
4. විශ්කම්භයෙන් සමාන නළ සම්බන්ධ කිරීම හා විශ්කම්භයෙන් අසමාන නළ සම්බන්ධ කිරීමට ය.
5. විශ්කම්භයෙන් අසමාන නළ සම්බන්ධ කිරීම හා නළයේ දිශාව වෙනස් කිරීම ය.

38.ජලයේ යෝග්‍යතාව මැන බැලීම සඳහා කරනු ලබන පරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. ජලයේ PH අගය මැනීම
B. ජලයේ උෂ්ණත්වය මැනීම
C. ජීව විද්‍යාත්මක ඔක්සිජන් ඉල්ලුම මැනීම
D. ජලයේ අඩංගු ක්ෂුද්‍රජීවීන් ප්‍රමාණය මැන බැලීම
E. ජලයේ අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය මැන බැලීම

ඉහත පරීක්ෂණ අතරින් භෞතික පරීක්ෂණයක් හා ජීව විද්‍යාත්මක පරීක්ෂණයක් ඇතුලත් වරණය වනුයේ,

1.A සහ C ය. 2. C සහ D ය. 3. B සහ D ය
4.D සහ E ය. 5. A සහ E ය.

39.පහත දක්වා ඇති වරණ අතරින් විද්‍යුත් ශක්තිය , තාප ශක්තිය බවටත් විද්‍යුත් ශක්තිය චාලක ශක්තිය බවටත් පත් කරන උපකරණ පිළිවෙලින් දක්වා ඇත්තේ,

1. විදුලි උඳුන සහ ක්ෂුද්‍ර තරංග උඳුන ය. 2.ස්ත්‍රික්කය හා බත් පිසිනය ය.
3. බත් පිසිනය හා විදුලි පෝරනුව ය. 4.බ්ලෙන්ඩරය හා ශීතකරණය ය
5. බත් පිසිනය හා බ්ලෙන්ඩරය ය

40.පහත දැක්වෙන විදුලි උපකරණවල විද්‍යුත් ක්ෂමතාව වැයවන ආකාරය,අවරෝහණය වන ලෙස දක්වා ඇති පිළිතුර වන්නේ,

1. විදුලි ස්ත්‍රික්කය, CFL විදුලි පහන් සහ රූපවාහිනිය ය.
2. විදුලි ස්ත්‍රික්කය, රූපවාහිනිය සහ LED විදුලි පහන් ය.
3. LED විදුලි පහන්, විදුලි ස්ත්‍රික්කය සහ තාප දීප්ත විදුලි පහන් ය.
4. CFL විදුලි පහන්, රූපවාහිනිය සහ විදුලි ස්ත්‍රික්කය ය.
5. තාප දීප්ත විදුලි පහන්, විදුලි ස්ත්‍රික්කය සහ CFL විදුලි පහන් ය.

41.පුනර්ජනනීය සම්පත් පිළිබඳව **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,

1. නැවත නැවත භාවිතයට ගතහැකි ස්වභාවික සම්පතක් වීම
2. මුළුමනින්ම ප්‍රතිස්ථාපනය කළ හැකි හෝ ක්ෂය කළ නොහැකි සම්පතක් වීම
3. නැවත ජනනය වීමේ හැකියාවක් නොමැති හෝ ඉතා අවම ජනනය වීමේ හැකියාවක් ඇති සම්පතක් වීම
4. භාවිතා කරන වේගයට වඩා වැඩි වේගයෙන් ජනනය වීමට හැකියාවක් ඇති සම්පතක් වීම
5. ස්වාභාවිකව ජනනය වීමේ හැකියාවක් තිබීම

42. අපද්‍රව්‍ය වර්ගීකරණයේ දී උපද්‍රවකාරී **නොවන** අපද්‍රව්‍යයක් වන්නේ

1.සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය ය. 2.කාර්මික අපද්‍රව්‍ය ය. 3.රසායනික අපද්‍රව්‍ය ය.
4.කෘෂිකාර්මික අපද්‍රව්‍ය ය. 5.විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ය.

43. ආහාර ද්‍රව්‍යවල ඇති, එහි ක්‍රියාකාරීත්වයට දායක වන ජෛව ක්‍රියාකාරී සංඝටක පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A. ප්‍රතිශක්තිකරණ පද්ධතිය ශක්තිමත් කරයි.
B. ආහාර ජීර්ණ පද්ධතියේ හානිදායක බැක්ටීරියා වර්ධනය වළක්වයි.
C. පිළිකා හා මානසික ආතතිය අඩු කරයි.
D. ක්ෂුද්‍රජීවී සමතුලිතතාව ඇති කරයි.

ඉහත කරුණු අනුව ප්‍රෝබයෝටික් පිළිබඳව නිවැරදිව තොරතුරු දක්වා ඇති කරුණු වන්නේ,

1.A සහ B ය. 2. A සහ C ය. 3. A සහ D ය.
4. C සහ D ය. 5. B සහ D ය.

44.ආහාර පිසීමේදී පිටවන විමෝචන අඩුකිරීමට ගතහැකි ක්‍රියාමාර්ගයක් **නොවන්නේ,**

1. ගෑස් උඳුනේ නිල් දැල්ල භාවිත කිරීම
2. ආහාර පිසීමේදී පියන ඇර පිසීම
3. ආහාර පිසීමේදී අවශ්‍ය ප්‍රමාණයට පමණක් ජලය යෙදීම
4. විශාල භාජනවල ආහාර නොපිසීම
5. ගෑස් උඳුන්වල පිසීමේදී විශේෂිත මැටි භාජන භාවිත කිරීම

45.මානසික පීඩනය පෙන්නුම් කරන චිත්තවේගී ලක්ෂණයකි.

1.කනස්සල්ල 2.අලසබව 3.කලබල වීම
4.ආහාර අරුචිය 5.තීරණ ගැනීමට නොහැකි වීම

46.නව යොවුන් අවධියේ සංවර්ධනය පිළිබඳ **අසත්‍ය** ප්‍රකාශය කුමක්ද?

1. කායික වර්ධනය වේගයෙන් සිදු වේ.
2. බුද්ධිමය වර්ධනය වේගයෙන් සිදු වේ.
3. චිත්තවේගික වර්ධනය වේගයෙන් සිදු වේ.
4. ලිංගික වශයෙන් පරිණත වේ.
5. ස්ව සංකල්ප ගොඩනගා ගැනීමට අකමැති වේ.

47.පුද්ගලයකුගේ පෞරුෂය කෙරෙහි ප්‍රබල ලෙස බලපාන බාහිර සාධක වන්නේ,

1.පවුල සහ පාසල ය. 2. හමේ වර්ණය සහ පෙනුම ය. 3. පෙනුම සහ පවුල ය.
4.කථන හැකියාව සහ පාසල ය. 5. හීනමානය සහ අධිමානය ය.

48.දරුවන් තුළින් පිළිබිඹුවන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. තර්ක කිරීමට පෙළඹේ.
B. සැමවිටම දෙමාපියන් අනුගමනය කරයි.
C. හුදකලා වීමට ප්‍රිය කරයි.
D. නවීන විලාසිතා අනුගමනය කරයි.

ඉහත ලක්ෂණ අතරින් යොවුන්වියට සුවිශේෂී වූ ලක්ෂණ වනුයේ

1.A සහ B ය. 2. A සහ D ය. 3. B සහ C ය.
4.D සහ C ය. 5.A සහ C ය.

49.ව්‍යාපාරයක නිෂ්පාදනවල තත්ත්ව පාලනයේදී ලබා දෙන ඉහළ තත්ත්ව සහතික වනුයේ,

1. CIMP සහ HACCP ය.
2. SLS සහ GMP ය.
3. GMP , ISO සහ SLS ය.
4. SLS , ISO සහ HACCP ය.
5. HACCP , GMP සහ ISO ය.

50.පංචවිධ සංකල්පය පිළිවෙලින් දක්වා ඇති වරණය වන්නේ

1. පිළියෙල කිරීම, පිරිසිදු කිරීම, තේරීම, සම්මතකරණය, පුහුණුව සහ ශික්ෂණය යි.
2. තේරීම, පිළියෙල කිරීම,පිරිසිදු කිරීම, සම්මත කරණය, පුහුණුව සහ ශික්ෂණය යි.
3. සම්මතකරණය, තේරීම, පුහුණුව, පිළියෙල කිරීම, ශික්ෂණය සහ පිරිසිදු කිරීම යි.
4. පුහුණුව, සම්මතකරණය, පිළියෙල කිරීම, තේරීම, ශික්ෂණය සහ පිරිසිදු කිරීම යි.
5. පිරිසිදු කිරීම , තේරීම , පිළියෙල කිරීම, සම්මතකරණය, ශික්ෂණය සහ පුහුණුව යි.

අධ්‍යාපන අමාත්‍යාංශය - තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

28 ගෘහ ආර්ථික විද්‍යාව

2024 අ.පො.ස(උසස් පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

11 පත්‍රය

කාලය පැය 3 මිනිත්තු 10

උපදෙස්

පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් , පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

---

(1)

i. **'**ඉවැසි හරිතාගාර ආවරණය**'** යනු කුමක්ද?

ii. විදුලි සැපයුමේ ප්‍රධාන ආකාර **දෙක** නම් කර ඉන් **එකක්** කෙටියෙන් හඳුන්වන්න.

iii. පෙප්ටයිඩ බන්ධනයක් ලෙස හඳුන්වන්නේ කුමක්ද?.

iv. ආහාර ජීර්ණයේ දී මහාන්ත්‍රයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් **දෙකක්** ලියන්න.

v. කෘත්‍රිම කෙඳි නිෂ්පාදනයේ දී, පොලිමර් කෙඳි බවට පත් කිරීමේ ප්‍රධාන ක්‍රම **දෙක** නම් කරන්න.

vi. නූල් නිෂ්පාදනයේ මූලික පියවර දෙක සඳහන් කරන්න.

vii. සමාජීය විවේකයට අදාළ ක්‍රියාකාරකම් **දෙකක්** ලියන්න.

viii. කාබනික ගොවිතැනෙහි ජෛව විද්‍යාත්මක වාසි **දෙකක්** ලියන්න.

ix. දරුවන් තුළ ඇති වන මානසික පීඩනයේ දී පෙන්නුම් කරන චිත්තවේගික ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

x. වාචික සන්නිවේදනයේ වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 2 × 10 - මුළු ලකුණු 20)

(2)

i. නිර්මාණකරණයේ මූලධර්මයක් ලෙස සමානුපාතය හඳුන්වා ඒ සඳහා වාස්තු විද්‍යාඥයින් විසින් යොදා ගන්නා සංකල්ප **දෙක** සඳහන් කරන්න. (ලකුණු 04)

ii. නිර්මිත පරිසර නිර්මාණකරණයේ දී සලකා බලනු ලබන උපයෝගිතා සාධකයක් වන සැකැස්ම හා පිහිටීම පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. වැසි ජලය සංරක්ෂණය කිරීමේ ප්‍රයෝජන **හතරක්** ලියන්න. (ලකුණු 04)

iv. විකල්ප බල ශක්ති ප්‍රභව නම් කර, ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(3)

i. යාන්ත්‍රික ජීර්ණය හා රසායනික ජීර්ණය හඳුන්වන්න. (ලකුණු 03)

ii. උග්‍ර තීව්‍ර මන්දපෝෂණයේ ආකාර **දෙක** දක්වා , එහි රෝග ලක්ෂණ **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04)

iii. කිරි හා කිරි නිෂ්පාදන, ආහාර වේලට එක්කර ගැනීමේ වැදගත්කම කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. ස්ථූලතාවයෙන් පෙළෙන අයෙකු සඳහා දිනකට බොජුන්පතක් සැලසුම් කරන්න.(ලකුණු 05)

(මුළු ලකුණු 16)

(4)

i. ආහාර ආසාදනය හඳුන්වා, එමගින් ඇති වන රෝග **තුනක්** නම් කරන්න. (ලකුණු 04)

ii. ආහාරයේ ඔක්සිකරණ / ඔක්සිහරණ විභවය ක්ෂුද්‍ර ජීවී වර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. යාන්ත්‍රික වියළීමේ ක්‍රම **හතරක්** නම් කර , ඉන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. ව්‍යාපාරයක් සාර්ථකව පවත්වා ගැනීමට දායක වන අභ්‍යන්තර හා බාහිර ආචාර ධර්ම **දෙක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(5).ඇඟලුම් කර්මාන්තශාලාවක නිමි ඇඳුම් නිෂ්පාදනය විවිධ පියවර යටතේ සිදු කරයි.

i. (a) “පිරිසැලසුම” යන්න හඳුන්වන්න. (ලකුණු 01)
(b) පිරිසැලසුම් නිපැයුමට අදාළ පියවර කෙටියෙන් දක්වන්න. (ලකුණු 02)

ii විශේෂ අවස්ථාවල දී රෙදි සඳහා දෙනු ලබන නිමාවක් වන “ සැන්ෆරයිස් කිරීම “ (Sanforizing) පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii ඇඟලුම් කර්මාන්තයේ දී ඇඳුම් නිර්මාණයක ගුණාත්මක බව කෙරෙහි සලකා බලන කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

iv රවුම් හැඩැති මේස රෙද්දක් නිර්මාණය කිරීම සඳහා උචිත මෝස්තරයක් ඇඳ එය අලංකාර කිරීමට යොදා ගන්නා විසිතුරු මැහුම් ක්‍රම හා ඒවා යොදන ස්ථාන සඳහන් කරන්න. (ලකුණු 05)(ලකුණු 16)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(6)

i. තිරසාර සම්පත් පරිභෝජනය යන්න හඳුන්වා එහි වැදගත්කම දැක්වෙන කරුණු **තුනක්** කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. ''ආහාර පා සලකුණු''(Food foot Print) අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 04)

iii. විවේකය ප්‍රතිමෝදනය සඳහා යොදා ගැනීමේ දී බලපාන සාධක **හතරක්** නම් කර ඉන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. සංචාරක කර්මාන්තයේ කාලීන ප්‍රවණතා ඉදිරිපත් කරන්න. (ලකුණු 04)(මුළු ලකුණු 16)

(7)

i. නව යොවුන් වියේ සංවර්ධන ක්ෂේත්‍ර නම් කරන්න. (ලකුණු 03)

ii. නව යෞවනයන් තුළ මානසික ගැටලු ඇති වීම කෙරෙහි බලපාන සාධක **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. යොවුන් දරුවන්ගේ පෞරුෂ වර්ධනය කෙරෙහි පාසලෙහි දායකත්වය විස්තර කරන්න. (ලකුණු 04)

iv. "සන්නිවේදන මාධ්‍ය යෞවනයින් තුළ ගැටලු ඇති කිරීමට හේතු විය හැකිය."කෙටියෙන් විමසන්න. (ලකුණු05)

(මුළු ලකුණු 16)

(8).පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. නිවසෙහි අප ජලය බැහැර කිරීම.

II. පැස්ටරීකරණයේදී භාවිත කරන ඉහළ උෂ්ණත්ව කෙටි කාල ක්‍රමය (HTST)

III. නොවියන ලද රෙදි පිළි

IV. 3R සංකල්පය

V. නව යෞවනයා මුහුණ දෙන අධ්‍යාපන ගැටළු (ලකුණු 4 × 4 = මුළු ලකුණු16)

PAST PAPERS WIKI
(11) WWW.PastPapers.WiKi (11)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

අධ්‍යාපන අමාත්‍යාංශය - තාක්ෂණ අධ්‍යාපන ශාඛාව,
28 ගෘහ ආර්ථික විද්‍යාව
2024 අ.පො.ස(උසස් පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය

1 – 4	11 – 4	21 – 3	31 – 3	41 – 3
2 – 3	12 – 2	22 – 4	32 – 5	42 – 4
3 – 4	13 – 1	23 – 2	33 – 2	43 – 1
4 – 2	14 – 2	24 – 5	34 – 5	44 – 2
5 – 3	15 – 1	25 – 1	35 – 2	45 – 1
6 – 5	16 – 3	26 – 1	36 – 3	46 – 5
7 – 3	17 – 2	27 – 2	37 – 4	47 – 1
8 – 5	18 – 5	28 – 3	38 – 3	48 – 2
9 – 5	19 – 3	29 – 5	39 – 5	49 – 4
10 – 4	20 – 5	30 – 4	40 – 2	50 – 2

(මුලු ලකුණු 50)

11 පත්‍රය

(1)

I. මානව ක්‍රියාකාරකම් නිසා හරිතාගාර වායු සාන්ද්‍රණය ඉහළ යාම හේතුවෙන් පෘථිවිය මතුපිට උෂ්ණත්වය ඉහළ යාමේ ක්‍රියාවලිය වේගවත් කරන ලද හරිතාගාර ආවරණය, ඉවැසි හරිතාගාර ආවරණය ලෙස හඳුන්වයි.
(ලකුණු 02)

II. සරල ධාරා විදුලිය
ප්‍රත්‍යාවර්ථ ධාරා විදුලිය

සරල ධාරා විදුලිය
බැටරි මගින් ලබාගන්නා විදුලිය
ප්‍රත්‍යාවර්ථ ධාරා විදුලිය
ප්‍රධාන විදුලි සැපයුම මගින් ලබාගන්නා විදුලිය(ජාතික විදුලිබල පද්ධතිය මගින්) (ලකුණු 02)

iii. එක් ඇමයිනෝ අම්ලයක කාබොක්සිල් කාණ්ඩය හා අනෙක් ඇමයිනෝ අම්ලයේ ඇමයිනෝ කාණ්ඩය අතර ඇතිවන බන්ධනය පෙප්ටයිඩ් බන්ධනයක් නම් වේ.

iv. (ලකුණු 02)

- ජලය හා ඛනිජ නැවත රුධිරයට අවශෝෂණය වීම.
- PH අගය 5.6 - 6.9 පමණ ආම්ලික වේ.
- මහාන්ත්‍රයේ ජීවත් වන බැක්ටීරියා , විටමින් K හා බයොටින් නිපදවන අතර මහාන්ත්‍රයේදී ඒවා රුධිරයට අවශෝෂණය වීම.
- ගුද මාර්ගය ඔස්සේ ගමන් කර ගුදයෙන් සහ අවශේෂ බැහැර කිරීම. (ලකුණු 02)

v. (1) ද්‍රවායන කැටීම
(2) ද්‍රව කැටීම (ලකුණු 02)

vi. (1) දිග කෙඳි භාවිතයෙන් නූල් නිෂ්පාදනය
(2) කෙටි කෙඳි භාවිතයෙන් නූල් නිෂ්පාදනය (ලකුණු 02)

vii.

- පවුලේ සාමාජිකයන් සමග සතුටු සාමීචියේ යෙදීම
- නෑදෑයන් හා මිත්‍රයින් සමග ගමන් බිමන් යාම
- සමකාලීනයින් සමග සාද පැවැත්වීම
- පවුලේ නෑදෑයන් සමග පවත්වන ප්‍රියසම්භාෂණ වැනි උත්සවවලට සහභාගී වීම (ලකුණු 02)

viii.

- රසායනික ද්‍රව්‍ය භාවිතා නොකරන නිසා පස , ජලය , වාතය දූෂණය නොවීම
- කොම්පෝස්ට් භාවිතය නිසා සම්පත් උපරිම ලෙස භාවිත වීම
- වස විසෙන් තොර ආහාර ලැබීම
- ජෛව විවිධත්වය වැඩි වීම
- පරිසර පද්ධතියේ තිරසාර බව ආරක්ෂා කිරීම
- ක්ෂුද්‍ර ජීවී හායනය අඩු වීම
- පාංශු උෂ්ණත්වය ආරක්ෂා වීම (ලකුණු 02)

ix.

- අධික ලෙස බිය වීම
- තිගැස්සීම
- කෝපය
- ද්වේෂය
- කනස්සල්ල
- නොරුස්සන ස්වභාවය ආදී (කරුණු 4 ට ලකුණු 02)

x.

- ප්‍රතිචාරය ඉතා ඉකිමණින් ලබා ගත හැකි වීම
- පණිවිඩය ලබන්නාගේ ඉරියව් හා හැසිරීම් රටා අධ්‍යනය කිරීමට හැකි වීම
- අපහැදිලි අවස්ථා පැහැදිලි කරගැනීමට හැකි වීම (ලකුණු 02)(මුළු ලකුණු 20)

(2)

i. නිර්මාණයක් සැකසීමේ දී එහි දිග , පළල හා උස මෙන්ම දෘශ්‍ය බර හා ප්‍රමාණය යන සාධක එකිනෙක හා ගැළපෙන අනුපාතයන්ගෙන් සකස්කර ගැනීම සමානුපාතික බව වේ.

- ස්වර්ණමය අනුපාතය
- ෆයබොනාසි වක්‍රය (Fibonacci sequence) (ලකුණු 04)

ii. සැකැස්ම හා පිහිටීම මෙහිදී භෞතික පරිසරය හා සැසඳීම විස්තර කෙරේ.එනම් පොළවේ සැකැස්ම අනුව උස් බිමක්ද තැනිතලා බිමක් ද වගුරු බිමක්ද යනාදී වශයෙන් සලකා බැලිය යුතුය. පොළවේ ස්වභාවය අනුව ගොඩනැගිල්ලේ ස්වභාවය ද වෙනස් වේ. ඉඩමේ හැඩය , පිහිටීම හා බෑවුම් ස්වභාවය අනුව නිවසේ හැඩය හා පිහිටීම වෙනස් විය යුතුය. එමෙන්ම පරිසරයේ වායුගෝලීය තත්ත්වය හා සූර්යාලෝකය වැටෙන ආකාරය අනුව නිවසේ පිහිටීම හා හැඩය වෙනස් විය යුතුය.

(ලකුණු 04)

iii

- භූගත ජලය සංරක්ෂණය වීම.
- වැසි ජලය රැස් කර තබා ගැනීම නිසා ප්‍රදේශයේ ජල ගැලීම් අවම වීම.
- නළ ජලය සඳහා ඉල්ලුම අඩුවීම මගින් ජල සම්පාදන පද්ධතිය සඳහා වන වියදම අඩුකළ හැකි වීම.
- ජල පොම්ප භාවිතය අවම වන හෙයින් බලශක්ති සංරක්ෂණය වීම.
- වැසි ජලය මෘදු බැවින් සේදීම සඳහා අවශ්‍ය සේදුම් කුඩු/සබන් ප්‍රමාණය අඩු වීම.
- ද්විතික හා තෘතියික අවශ්‍යතා සඳහා වැසි ජලය පාවිච්චි කළ හැකි වීමෙන් නළ ජලය සඳහා වැය වන වියදම් අවම වීම. (ලකුණු 04)

iv.

- සූර්ය කෝෂ
- ජීව වායුව
- කුඩා පරිමාණ ජල විදුලි බලාගාර

<u>සූර්ය කෝෂ</u>:-සූර්යකෝෂ මතට සූර්යාලෝකය පතිත වූ විට එම ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය වේ. මෙහිදී ලැබෙනුයේ කුඩා විද්‍යුත් ශක්ති ප්‍රමාණයකි. එබැවින් වැඩි විද්‍යුත් ශක්ති ප්‍රමාණයක් ලබාගැනීම සඳහා සූර්ය කෝෂ රාශියක් එකට සම්බන්ධ කර ඇති සූර්ය පැනල භාවිත කරයි. වර්තමානයේ බොහෝ නිවෙස්වල සූර්ය පැනල සවිකර ඇති ආකාරය දක්නට ලැබෙයි. චන්ද්‍රිකාවල විද්‍යුත් උපකරණ ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය විද්‍යුතය ලබා ගන්නේද ඒවායේ සවිකර ඇති සූර්ය පැනලවලිනි.

<u>ජීව වායුව</u>:- ඉන්ධනයක් ලෙස භාවිත කළ හැකි ශාක හා සත්ත්ව කොටස් ජෛව ස්කන්ධ ලෙස හඳුන්වයි. ජෛව ස්කන්ධ භාවිත කරමින් ජීව වායුව නමින් හඳුන්වන ඉන්ධන නිපදවිය හැකිය. නිවෙස්වලින් බැහැර කරන ශාක කොටස් හා සත්ත්ව ද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය හා කෘෂිකාර්මික අස්වැන්න නෙළාගත් පසු ඉතිරි වන ද්‍රව්‍යද මේ සඳහා යොදාගත හැකිය. මේවා සංවෘත අවකාශයක දිරාපත් වීමට සලස්වා එයින් පිටවන ජීව වායුව ආලෝකය හා තාපය ලබා ගැනීම සඳහා යොදාගත හැකිය.

<u>කුඩා පරිමාණ විදුලිබලාගාර</u>:-ජල විදුලි බලාගාරවල විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය වන්නේ ගලායන ජලයේ චාලක ශක්තියෙන් උස් ස්ථානයක ගබඩා කර ඇති ජලයේ විශාල ශක්තියක් අන්තර්ගත වේ. ජල විදුලි බලාගාරය ඉදිකරන්නේ ඊට වඩා පහත් ස්ථානයක ය. ජලාශයේ සිට නල තුළින් වේගයෙන් ඇදීයන ජල පහරින් නල බඹර කරකවා එමගින් විද්‍යුත් ජනකය ක්‍රියාත්මක කළවිට විද්‍යුත් ශක්තිය නිපදවෙයි. කුඩා ජල පහරවල් ආශ්‍රිතවද මෙම උපක්‍රමය මගින් කුඩා විදුලි ප්‍රමාණයක් උත්පාදනය කර ගත හැකිය. (ලකුණු 04)

(3)

i. යාන්ත්‍රික ජීර්ණය :- විශාල ආහාර කොටස් කුඩා කොටස්වලට කැඩීම යාන්ත්‍රික ජීර්ණයයි.
රසායනික ජීර්ණය :- ආහාර ජීර්ණයේ දී එන්සයිම මගින් විශාල අණු කුඩා අණු බවට පත් කිරීම රසායනික ජීර්ණයයි. (ලකුණු 02)

ii.

1. මැරස්මස්
2. ක්වෝෂියෝකෝර්

<u>මැරස්මස්</u> - ඉතාමත් කෙසඟ අස්ථි බේරුණු සිරුරක් තිබීම.
වයසක පෙනුමක් ලබා දේ.

<u>ක්වෝෂියෝකෝර්</u> - මුහුණ උදරය හා පාද ඉදිමේ. (ලකුණු 04)
මලානික බව (රෝග 02 ට ලකුණු 02)
උදාසීන බව (රෝග ලක්ෂණ ½ ×4)

iii.

- කිරිවල විටමින් B12 අඩංගු වේ. එමගින් ස්නායු පද්ධතියේ ක්‍රියාකාරිත්වයට හා රතු රුධිරාණු නිෂ්පාදනයට උපකාරී වීම
- යොදය සහිත කිරිවල විටමින් A අඩංගු වීම එමගින් ඇස්වල හා සමෙහි නිරෝගීතාවයට උපකාරී වීම
- කිරිවල අඩංගු කැල්සියම් හා ප්‍රෝටීන් මගින් දත්ත හා අස්ථි වර්ධනයට උපකාරී වීම
- මුදවපු කිරි හා යෝගට්වල ඉහළ ප්‍රෝටීන් සංයුතිය හා ඒවායේ ඇති කැල්සියම් ශරීරයට අවශෝෂණය වීම පහසුවීම
- කිරිවල අඩංගු මේදය හා ලැක්ටෝස් සීනි මගින් ශක්තිය ලබා දීම

(කරුණු 04 ට ලකුණු 05)

iv.

- කාබෝහයිඩ්‍රේට් හා මේද අඩංගු ආහාර අඩු කිරීම
- මාංශ භෝග , එළවළු , පලතුරු හා තන්තු සහිත ආහාර වැඩිපුර එක්කිරීම
- පැණිරස බීම වර්ග අතුරුපස අඩුකර තිබීම
- රුචිකත්වය ඇතිවන අයුරින් ආහාර ඇතුළත් කිරීම
- ප්‍රධාන ආහාර වේල් තුන හා උදෑසන හා සවස ඇතුළුව ආහාර වේල් පහක් සඳහන් වීම

(ලකුණු 05)
(මුළු ලකුණු 16 යි)

(04).

i. අප ගන්නා ආහාරයක් සමග ක්ෂුද්‍ර ජීවීන් ශරීරයට ඇතුළුවීම නිසා රෝග හට ගැනීම ආහාර ආසාදනයයි.

1. සැල්මොනෙල්ලෝසිස්
2. කොළරාව
3. පාචනය (ලකුණු 04)

ii. නැවුම් ආහාර තුළ ඔක්සිකරණ /ඔක්සිහරණ විභවය පහළ නිසා ආහාරයට බාහිර පරිසරයෙන් ඔක්සිජන් විසරණය වීම වැළකේ. ආහාරය කල්ගතවන විට මෙම ආරක්ෂණ යාන්ත්‍රණය බිඳ වැටීම නිසා ඔක්සිකරණ /ඔක්සිහරණ විභවය ඉහළ යාමෙන් ආහාරය තුළට ඔක්සිජන් විසරණය වී කුෂුද්‍ර ජීවීන් වේගයෙන් ඇතුළු වී ආහාරය නරක් වේ. (ලකුණු 04)

iii.

- කැබිනට්ටු වියළනය
- උමං වියළනය
- බිං වියළනය
- රික්තක වියළනය
- විසිරි වියළනය

- කැබිනට්ටු වියළනය , උමං වියළනය
  අඩු තෙතමනයක් සහිත ආහාර ද්‍රව්‍ය සඳහා උචිතය. මෙහිදී ආහාරය තුළින් වායු ධාරා ගමන් කරයි.
- රික්තක වියළනය
  අඩු උෂ්ණත්ව හා අඩු පීඩන තත්ත්ව යටතේ සිදු කරයි.ආහාරයේ රසායනික සංයුතිය හා බාහිර ස්වභාවයට තද හානි සිදු නොකරමින් ජලය පිටකරයි.
- බිං වියළනය
  ද්‍රව ආහාර සඳහා පමණක් භාවිත කරයි.භ්‍රමණය වන බෙරයක් වැනි සිලින්ඩරාකාර උපකරණයක් තුළින් හුමාලය ගමන් කිරීමට සැලැස්වීම.
- විසිර වියළනය
  ද්‍රවමය ආහාර වියළීමේදී පමණක් භාවිත වේ.ඉතා උණුසුම් වායු ධාරා උපකරණය තුළින් ගමන් කරවයි.උපකරණයේ ඉහළ කොටසේ ඇති Atomizer නම් ඉතා සියුම් බිඳිති සාදන කොටස වෙත ද්‍රව ආහාර යොමු කරයි.මෙම කොටස ඉතා වේගයෙන් භ්‍රමණය වී උණුසුම් වාතයෙන් පිරුණු සිලින්ඩරාකාර කොටසට මුදාහරී.එහිදී ජලය ඉවත් වී ඝන අංශු බවට පත් වේ.

(නම් කිරමට 02)
(හැඳින්වීමට 02)
(ලකුණු 04)

iv. අභ්‍යන්තර ආචාර ධර්ම

- ව්‍යාපාරයක් කිරීමේදී ව්‍යාපාරය තුළ කටයුතු කළයුතු ආකාරය
- නිෂ්පාදනය සිදු කළ යුතු පිළිවෙළ
- ගණුදෙනු කළ යුතු ආකාරය
- සේවක අයිතිවාසිකම් පිළිබඳව
- වැටුප් , ඉල්ලීම් හා පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීම

බාහිර ආචාරධර්ම

- සාධාරණ මිල ප්‍රතිපත්ති
- සාධාරණ නිෂ්පාදනය
- අලෙවිකරණය
- ගුණාත්මක පාලනය (කරුණු 02 බැගින් -ලකුණු 02)
- ව්‍යාපාරික නීති අනුගමනය (විස්තර කිරීමට - ලකුණු 02)

(ලකුණු 04)
(මුළු ලකුණු 16)

(5).i.a). නිර්මාණය පිළිබඳ සියලු තොරතුරු ඇතුලත් දළ සැලැස්මයි. පිරි සැලසුම මගින් නිර්මාණයේ සමස්ත ස්වභාවය පිළිබඳව කිසියම් අවබෝධයක් ලබාගත හැකිය. (ලකුණු 01)

b).පිරිසැළසුම් නිපැයුමට අදාළ පියවර

1.පිරිසැලසුමට අදාළව ආදර්ශ ඇඳුමක් මසා නිමකිරීම.

මෙහිදී නියමිත රෙදි වර්ගය තෝරා අවශ්‍යා උස , පළල , හැඩය අනුව පතරොම සකසා ඇඳුම කපා අදාළ මැහුම් ක්‍රම පන්නය අනුව ඉදිරිපස , පිටුපස විවර කොලරය ඇත්නම් එය රැලි ඔපනැලි ආදී ඇඳුමට අදාළ සියලුම අංග යොදයි.

2. මසන ලද ආදර්ශ ඇඳුම කමිටුවට ඉදිරිපත් කිරීම

මෝස්තර නිර්මාණකරු ,ඇඳුම මැසූ පුද්ගලයා කළමනාකරු හා මිලදී ගන්නා අයගෙන් සමන්විත කමිටුව ඇඳුම නිරීක්ෂණය කර අවශ්‍යා වෙනස්කම් සිදුකළ යුතු ස්ථාන හා කරුණු පිළිබඳ තීරණවලට එළඹේ.

3. යෝජනා කරන ලද නියැදිය නැවත සකස් කිරීම හා පරීක්ෂා කිරීම නැවත අනුමත කිරීම.

4. මෙම නියැදිය නැවත අනුමත වූ පසු ඇඳුමට අදාල පතරොම් නිර්මාණය කිරීම

පතරොම නිර්මාණය කිරීම දක්වා පියවර 03 ට -ලකුණු 03)

ii.මෙය නිමාව විශේෂ අවස්ථාවලදී ලබාදෙන යාන්ත්‍රික ක්‍රියාවලියකි.

1. රෙදි භාවිතයේදී හා සේදීමේදී සිදුවන හැකිළීම වළක්වා ගැනීම සඳහා සිදුකරයි.
2. කපු රෙදි සඳහා බහුලව මෙම ක්‍රියාවලිය සිදුකරයි.වෙනත් කෘතිම රෙදි සඳහා ද සිදුකළ හැකිය. සැන්ෆරයිස් කළ රෙදිවල ''Sanforized'' ලේබල් යොදා ඇත.
3. රෙදි හැකිළීම පාලනය කිරීමෙන් කල්පැවැත්ම හා නිමාව වැඩිදියුණු වේ.

(කරුණු තුනට ලකුණු 03)

iii.

- නිර්මාණය කරන ඇඳුමේ මෝස්තරය
- රෙදි වර්ගය
- යොදා ඇති මැහුම් වර්ග
- වර්ණ ගැළපීම
- ඇඳසිටීමේ පහසුව
- යොදා ඇති නිමාවන්
- නඩත්තු කිරීමේ පහසුව
- වියදම (කරුණු හතරක් සඳහා ලකුණු 04)

iv.රූපසටහන

a) මේස රෙද්ද මැදට හෝ මැද සිට පිටතට විහිදෙන ආකාරයට හෝ වාටිය ආසන්නව මෝස්තරය විහිදෙන ලෙස ඇඳ තිබීම.
පුනරුක්තිය තුළින් රිද්මය ඇතිවන ලෙස ඇඳ තිබීම. (ලකුණු 02)

b)



මෝස්තරයට ගැළපෙන විසිතුරු මැහුම්ක්‍රමය නම්කිරීම
වර්ණය සඳහන් කිරීම,වර්ණ ගැළපීම අනුව (ලකුණු 03)
එය පෙර මෝස්තරය මත හෝ යතුරක් මගින් දැක්විය හැකිය. (මුළු ලකුණු 16)

06.(i). සම්පත් , දිගුකාලීනව පිරිහීමට පත් නොවන සේ මිනිසාගේ වර්තමාන හා අනාගත අවශ්‍යතා ඉටුවන පරිදි ප්‍රයෝජනයට ගැනීම තිරසාර සම්පත් පරිභෝජනයයි. (ලකුණු 01)

- සම්පත් නාස්ති නොකරන නිසා ජෛව විවිධත්වය ආරක්ෂා වීම.
- පරිසර සමතුලිතතාව ආරක්ෂා වීම.
- සම්පත් හිඟතාවක් ඇති නොවීම.
- පරිසර දූෂණය අවම වීම.
- ස්වභාවික චක්‍රවල සමතුලිතතාව
  (උදා:-ජල චක්‍රය , කාබන් චක්‍රය , නයිට්‍රජන් චක්‍රය)
- වර්තමාන හා අනාගත පරම්පරාවට පෝෂණ අවශ්‍යතා සැපිරීම. (කරුණු 03ට ලකුණු 03)

(ලකුණු 04)

(ii).

1) ආහාර පා සලකුණු අගය වැඩි ආහාර පරිභෝජනය අවම කිරීම.
2) අවශ්‍ය ප්‍රමාණයට පමණක් මිල දී ගැනීම.
3) ශීතකරණ භාවිතයේ දී වැය වන විදුලි ප්‍රමාණය අවම වීම සඳහා උපක්‍රම භාවිතා කිරීම.
4) හැකිතාක් දුරට කාලීන එළවළු පලතුරු භාවිතය
5) ගෙවතු වගා ඇති කිරීම , කාබනික ගොවිතැන් කිරීම.
6) සැකසූ ආහාර භාවිතය අවම කිරීම.
7) පානීය ජලබෝතල් භාවිතය අවම කිරීම
8) පැණි බීම පානය අවම කිරීම හෝ ඉන් වැලකීම. (කරුණු විස්තර කිරීමට ලකුණු 04)

(iii).

1. වැය කළ හැකි ආදායම
2. යොදාගත හැකි කාලය
3. තාක්ෂණික දියුණුව
4. ආකල්ප
5. පහසුකම්
6. සමාජීය බලපෑම
7. ආරක්ෂාව හා නිදහස

1.වැය කළ හැකි ආදායම:-ආදායම වැඩිවත්ම ප්‍රතිමෝදනය සඳහා වැය කළ හැකි මුදල වැඩි වේ.
2.යොදාගත හැකි කාලය:-වෙන් කළ හැකි කාලය වැඩිවෙත්ම ප්‍රතිමෝදනය සඳහා ඉල්ලුම වැඩි වේ.
3.තාක්ෂණික දියුණුව:-ප්‍රතිමෝදන ක්‍රියා සාර්ථකව සිදු කර ගැනීමට නව තාක්ෂණය පස් ආකාරයට යොදා ගත හැකියි.

- ප්‍රවාහනය හා ප්‍රවේශ හැකියාව
- සුව පහසුව
- ආරක්ෂාව
- තොරතුරු ව්‍යාප්ත වීම.
- සන්නිවේදනය

4.ආකල්ප
විවේකය සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේදී මානව හැසිරීම් සැලකිල්ලට ගතයුතු අතර සමාජ විරෝධී ක්‍රියාවලින් වැළකීම පිළිබඳවත් අවධානය යොමුකළ යුතුය.
5.පහසුකම්
යටිතල පහසුකම් සංවර්ධනය , සතුටු උයන් , විනෝද උද්‍යාන , හෝටල් සේවා ප්‍රතිමෝදන ආයතන ආදිය ප්‍රතිමෝදනය සඳහා ඉල්ලුම වැඩිකරයි.

(සාධක 4 නම්කිරීමට ලකුණු 02)
(කරුණු දෙක පැහැදිලි කිරීමට ලකුණු 02)

iv.

1. චීන වෙළඳපොළෙහි විච්ඡින්න ශක්තිය
   2015 දී ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සඳහා දෙවන විශාලතම සංචාරක ප්‍රභවය චීනය වීම
2. අන්තර්ජාලය තුළින් වෙන්කර ගැනීමේ පහසුකම්
   (නවාතැන් ස්ථාන හා හොටෙල් , චාරිකා නියෝජිතයින් , ප්‍රවාහන පහසුකම් , සංචාරක ස්ථාන වැනි)
3. නිවාඩු ගත කිරීම පිළිබඳ නව නැමියාවක් තිබීම
4. මිනිස් පහස නොලත් ස්ථාන සහ සුවිශේෂ ස්ථාන ගවේෂණය
5. ධන කුවේරයන් ප්‍රායාන සංචාර කෙරෙහි යොමු වීම
   (සත්‍ය අත්දැකීම් සහිත අභ්‍යාකාෂතරණය)
6. තම රටට ආසන්න ප්‍රදේශවල සංචාරය

(කරුණු 04 ක් පැහැදිලි කිරීම ලකුණු 04)

(මුළු ලකුණු 16)

(7).i.

- කායික සංවර්ධනය
- මානසික සංවර්ධනය
- චිත්තවේගික සංවර්ධනය
- සමාජ සංවර්ධනය
- සදාචාර සංවර්ධනය
- බුද්ධි සංවර්ධනය(ප්‍රජානන) ක්ෂේත්‍ර හයට 1/2×6 = ලකුණු 03)

ii.

- කායික වර්ධනයේදී පවතින ගැටළු නිසා
  උදා:-උස අඩු වීම වැනි පෙනුමට බලපාන ස්ථුලතාව (බර වැඩි වීම) අහපසහවල වෙනස්කම්
- ලිංගික පර්වර්තනය ආශ්‍රිත ගැටළු (හෝමෝන අසමතුලිතතාව බලපෑමෙන්)
  - ද්විතියික ලිංගික ලක්ෂණ ගැටළු
  - රැවුල වැවීම අඩු වීම , මල්වරවීම ප්‍රමාද වීම
  - පියයුරු වර්ධනයේ ගැටළු
- බාහිර පෙනුම ආශ්‍රිතව ඇතිවන ගැටළු
  සමේ වර්ණය , හිස කෙස්වල ස්වභාවය
- ආහාර ගැනීමේ අක්‍රමිකතා නිසා ඇතිවන ගැටළු
  (ගැස්ට්‍රයිටීස්)
- ආර්තවය නිසා ඇතිවන ගැටළු
- නින්ද හා විවේකය අඩුවීමෙන් ඇතිවන ගැටළු
- ව්‍යායාම හා ශාරීරික අභ්‍යාසවල නොයෙදීමෙන් ඇතිවන ගැටළු
- අනවශ්‍ය ලෙස දෙමාපිය බලපෑම් , වගකීම් පැවරීම
- තම අවශ්‍යතා ඉටු නොවීම
- ප්‍රේම සබඳතා ඇතිවීම හා බිඳවැටීම් (ලකුණු 04)

iii.

- පාසලේ විෂය සමගාමී කටයුතුවලට යොමු කිරීම
- විෂය නායක පන්ති නායක ශිෂ්‍යනායක යොමු කිරීම
- වාද විවාද තරඟවලට යොමු කිරීම
- ක්‍රීඩා තරඟ හා ශාරීරික අභ්‍යාස කිරීම
- නායකත්ව වැඩමුළු පැවැත්වීම
- වගකීම් දැරීමට අවස්ථාව දීම
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- ශ්‍රමදාන කටයුතුවල යෙදීම
- ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරවීම
- සෞන්දර්ය හා කලා කටයුතු සංවිධානය කිරීම
- අත්වැඩ හා අත්කම්වලට යොමු කිරීම
- දරුවාගේ විශේෂ දක්ෂතා අගය කිරීම (ලකුණු 04)

iv.

- සන්නිවේදන මාධ්‍ය අසීමිත ලෙස ග්‍රහණය කර ගත හැකි වීම
- විවිධ මාධ්‍ය තුලින් සංසිද්ධිය සඳහා විවිධ කරුණු ඉදිරිපත් කිරීම
- සමහර සාවද්‍ය කරුණු පවා නිරවද්‍ය යන හැඟීම ඇතිවන සේ ඉදිරිපත් කිරීම
- යොවුන් මනසට ඉතා ආකර්ශනීය ලෙස සන්නිවේදනය කිරීම
- සමාජ සම්මත සාරධර්ම පිළිබඳ විකෘති අදහස් දැක්වීම
- සමාජ විරෝධී ක්‍රියාවන්ට නතුකර ගැනීම
- යොවුන් වියට ආවේණික ලක්ෂණ පිළිබඳ විකෘති කරන ලද තොරතුරු සැපයීම

මෙම කරුණු හොඳ / නරක , සම්මත/අසම්මත හරි වැරදි
තෝරා ගැනීමට ගැටළු ඇතුලත්ව කරුණු පහක් විස්තර කිරීමට
(ලකුණු 05)
(මුලු ලකුණු 16)

(8).

i. සනීපාරක්ෂක උපාංගයකට නළ මගින් සපයන ලද ජලය සේදීම හෝ නෑම වැනි කාර්යයන් සඳහා පාවිච්චි කළ විගස අපජලය බවට පත් වේ. මෙම අපජලය කෙළින්ම පරිසරයට මුදාහැරීම සුදුසු නැත. අපජලය උත්පාදනය වන ප්‍රධාන මූලාශ්‍ර

- වැසිකිළිවලින් පිටවන ජලය
- නෑමට යොදාගත් ජලය
- මුළුතැන්ගෙයි සේදීමට යොදා ගත් ජලය

ඉහත මූලාශ්‍ර අනුව අපජලය බැහැර කිරීම
විස්තර කිරීමට (ලකුණු 04)

ii.

- මෙම ක්‍රමයේදී ආහාර $72^{0}C$ පමණ උෂ්ණත්වයේ තත්පර 15 ක් තබා $10^{0}C$ තෙක් සිසිල් කර ශීතකරණයක ගබඩා කර තබයි.
- මෙහි මූලික අරමුණ වන්නේ ආහාරයේ ඇති ව්‍යාධිජනක මෙන්ම ඇතැම් එනිසයිම ද නිශේධනය කිරීමයි.
- මෙහිදී පැස්ටරීකෘත ආහාර ශීතකරණය තුළ $10^{0}c$ ට වඩා අඩු උෂ්ණත්වයක ගබඩා කළයුතු වන්නේ කාමර උෂ්ණත්වයේදී එම ආහාර නරක්වන බැවිනි.
- මෙහිදී කිරි , බිත්තර නිෂ්පාදන , මධ්‍යසාර නොවන හා අඩු මධ්‍යසාර ප්‍රමාණ අඩංගු බීම වර්ග පැස්ටරීකරණයට යොදා ගනියි.

(ලකුණු 04)

iii. කිසියම් බන්ධන ද්‍රව්‍යයක් හෝ වෙනත් ක්‍රියාවලියක් මගින් එකට අල්ලා සිටින කෙඳි ජාලයකින් සැදුණු පෙහෙකම් ව්‍යුහයක් නොවියන ලද රෙද්දක් ලෙස අර්ථ දැක්විය හැකිය. ෆෙල්ට් කිරීම , බැඳීම හා ලැමිනේටින් කිරීම මගින් මෙම රෙදි නිපදවිය හැක.
උදා:-තොප්පි , සපත්තු සඳහා යොදා ගනියි.

ෆෙල්ට් කිරීම , බැඳීම , ලැමිනේටින් කිරීම කෙටියෙන් පැහැදිලි
කළයුතුයි. (ලකුණු 04)

iv. කසල ප්‍රතිචක්‍රීකරණයේදී 3R සංකල්පය යොදා ගනී. 3R යනු
1.කසල උත්පාදනය අඩුකිරීම (Reduce)
2.නැවත භාවිතය(Reuse)
3.ප්‍රතිචක්‍රීකරණයRecycle)
කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

v.

- අවධානය රඳවා ගැනීමේ ගැටළු
- මතක තබා ගැනීමේ ගැටළු
- විෂයන් තෝරා ගැනීමේ ගැටළු
- තරඟකාරිත්වයට මුහුණදීමේදී ඇතිවන ගැටළු
- ඉගෙනුම් අපහසුතා

ගැටලු හතරක් නම් කර එක් ගැටලුවක් විස්තර කිරීම
(ලකුණු 04)
(මුළු ලකුණු 16)